**මූල්‍ය කළමනාකරණ ප්‍රතිසංස්කරණ වැඩ සටහනේ ( ආදායම් පරිපාලනය නවීකරණය කිරීම ) -2013**

---

මූල්‍ය කළමනාකරණ ප්‍රතිසංස්කරණ වැඩ සටහනේ ( ආදායම් පරිපාලනය නවීකරණය කිරීම) 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය (ශ්‍රීලංර) හා ආසියානු සංවර්ධන බැංකුව (ආසබැ) අතර 2004 දෙසැම්බර් 20 දින එළඹි අංක 2132 එස්ආර්අයි දරන ණය ගිවිසුමේ IV ව්‍යවස්ථාවේ 4.05(ආ) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 වැඩ සටහන ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා වැඩ සටහන් කාලය

---

මූල්‍ය කළමනාකරණ ප්‍රතිසංස්කරණ වැඩ සටහනේ ( ආදායම් පරිපාලනය නවීකරණය කිරීම ) ණය ගිවිසුමට අනුව , වැඩ සටහන ක්‍රියාත්මක කරවීම හා ක්‍රියාත්මක කිරීම සඳහා මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය වගකිව යුතු වේ. වැඩ සටහනේ අරමුණු වන්නේ, ආදායම් පරිපාලනය නවීකරණය සඳහා මූලිකව උපකරණ ප්‍රසම්පාදනය මත කේන්ද්‍ර කරගත් ආයතනික ශක්තිමත් කිරීම සඳහා සහායවීමයි. ණය ගිවිසුම අනුව වැඩ සටහනේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය එජඩො මිලියන 15 ක් වන අතර සම්පූර්ණ මුදලම මූල්‍යයනය කිරීම සඳහා ආසියානු සංවර්ධන බැංකුව එකඟවී තිබුණි. වැඩ සටහනේ කටයුතු 2004 දෙසැම්බර් 20 දින ආරම්භ කරන ලද අතර 2007 දෙසැම්බර් 31 දින වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේ වුවද ශ්‍රී ලංකා රජය විසින් කරන ලද ඉල්ලීම මත වැඩ සටහන නිම කිරීමේ දිනය ආසියානු සංවර්ධන බැංකුව විසින් 2011 දෙසැම්බර් 31 දින දක්වා දීර්ඝ කර තිබුණු අතර අරමුදල් ප්‍රතිපූර්ණය කර ගැනීම සඳහා 2012 මාර්තු 16 දක්වා කාලය අනුමත කර තිබුණි. කෙසේ වුවද ශ්‍රී ලංකා රජයේ අරමුදල් යොදා ගනිමින් වැඩ සටහනේ කටයුතු 2013 දෙසැම්බර් 31 දක්වා අඛණ්ඩව පවත්වා ගෙන ගොස් තිබුණි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාමත්, යෝග්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරාගැනීම සහ යොදාගැනීමත් අවස්ථාවෝචිතව සාධාරණ ලෙස ගිණුම්කරණ ඇස්තමේන්තු සකස් කිරීමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 2. විගණන විෂය පථය හා මතය සඳහා පදනම

---

මාගේ විගණන පරීක්ෂණ මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මෙම වාර්තාවේ ඇතුළත් විගණන මතය, අදහස් දැක්වීම් සහ සොයාගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය සහ පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් සහ කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි. මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන සාක්ෂි නියැදි පදනම මත පරීක්ෂා කිරීම්, මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති හා වැදගත් ඇස්තමේන්තු සහ මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ උපරිම දැනීම සහ විශ්වාසය පරිදි විගණන කටයුතු සඳහා අවශ්‍ය වන ප්‍රමාණවත් තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලදී. ඒ අනුව මාගේ මතය සඳහා ප්‍රමාණවත් පදනමක් මාගේ විගණනය මගින් සපයන බව මාගේ විශ්වාසයයි.

පහත සඳහන් දෑ තක්සේරු කිරීම පිණිස අවශ්‍ය යැයි සලකනු ලැබූ පද්ධති හා පාලන , ගනුදෙනු, වත්කම්, වගකීම් හා ගිණුම් වාර්තා පිළිබඳ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල වැඩ සටහන් කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ වැඩ සටහනේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසවන්තභාවය තහවුරු කිරීම පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ශ්‍රී ලංකා රජයෙන් සහ ණය සපයනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල්වලින් දරන ලද වැඩ සටහන් වියදම්, මූල්‍ය සහ භෞතික වශයෙන් වැඩ සටහනේ ප්‍රගතිය, වැඩ සටහනේ මෙහෙයුම්වලින් උද්ගත වූ වත්කම් හා වගකීම්, ණය යටතේ කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම් ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඇ) වැඩ සටහන ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව, වියදම් නිවැරදි ලෙස හඳුනා ගෙන තිබුණේ ද යන බව.

(ඈ) පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේ ද යන බව.

(ඉ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව.

## 3. මතය

------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව සහ මෙම වාර්තාවේ 5 ඡේදයේ දැක්වෙන කරුණුවලින් උද්ගත වන ගැලපීම්වලින් ඇතිවන බලපෑම් හැරුනු විට මා දරන්නා වූ මතය වනුයේ,

(අ) 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වැඩ සටහන නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ 2013 දෙසැම්බර් 31 දිනට වැඩ සටහනේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බවත්ය.

## 4 මූල්‍ය ප්‍රකාශන

----------------

### 4.1 මූල්‍ය කාර්යසාධනය

----------------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වැඩ සටහනේ වියදම රු.මිලියන 20.16 ක් වූ අතර, 2013 දෙසැම්බර් 31 දිනට වැඩ සටහනේ සමුච්චිත වියදම රු.මිලියන 1,807.7 ක් විය. සමාලෝචිත වර්ෂය සඳහා වියදම, 2012 වර්ෂය සඳහා වියදම සහ 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම පිළිබඳ සාරාංශයක් පහත ප්‍රකාශයෙන් දැක්වේ.

| වර්ගය | දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම | | 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම |
|---|---|---|---|
| | 2013 | 2012 | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| ලී බඩු හා සවි කිරීම් | - | - | 62.53 |
| ප්‍රාදේශීය ජාල පහසුකම් | - | 567.60 | 862.76 |
| සිවිල් වැඩ | - | - | 4.43 |
| සංවර්ධන වියදම් මත එකතු කළ අගය මත බදු සහ වෙනත් බදු | - | 112.74 | 135.66 |
| ව්‍යාපෘති කළමනාකරණය | 0.04 | 0.16 | 6.01 |
| ණය පොලී සහ බැඳීම් ගාස්තු | - | - | 68.37 |
| මූල්‍ය අධ්‍යයන ආයතනය ස්ථාපිත කිරීම | 20.12 | 647.82 | 667.94 |
| එකතුව | 20.16 | 1,328.32 | 1,807.7 |

## 5. විගණන නිරීක්ෂණ

### 5.1 නීති, රීති, රෙගුලාසි ආදියට අනුකූල නොවීම

මුදල් රෙගුලාසි 756 ප්‍රකාරව, වැඩ සටහනේ වත්කම් පිළිබඳ වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පවත්වා නොතිබුණි. තවද 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛනයක් හා 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව පරිගණක හා උපාංග පිළිබඳ ලේඛනයක් පවත්වා නොතිබුණි. එබැවින් ආදායම් පරිපාලන ආයතන අතර බෙදාහැරීම සඳහා ව්‍යාපෘති නියාමන ඒකකය විසින් මිලදී ගන්නා ලද රු.62,526,875 ක් වටිනාකම වූ වත්කම් පිළිබඳ භෞතික පැවැත්ම විගණනයේදී තහවුරු කළ නොහැකි විය.

### 5.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

ව්‍යාපෘතියේ කාර්යයන් පිළිබඳ මූල්‍ය හා භෞතික ප්‍රගතිය ඇගයීමට හැකිවීම සඳහා වාර්ෂික ක්‍රියාකාරි සැලැස්මේ පිටපත් හා ඒ පිළිබඳ ප්‍රගති වාර්තාවල පිටපත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. තවද ප්‍රසම්පාදනය කර හා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට සහ සුරා බදු දෙපාර්තමේන්තුවට භාරදෙන ලද වත්කම් හා වෙනත් ඉන්වෙන්ට්‍රි විෂයයන් පිළිබඳ ලැයිස්තුවක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

## 6. මූල්‍ය හා භෞතික කාර්යසාධනය

### 6.1 අරමුදල් උපයෝජනය

අරමුදල් මූලායනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදන, සමාලෝචිත වර්ෂය සඳහා අරමුදල් උපයෝජනය සහ 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම පිළිබඳ වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | මූල්‍යයනය සඳහා එකඟ වූ මුදල | | වාර්ෂික අයවැය ලේඛනයේ කරන ලද වෙන්කිරීම | සමාලෝචිත වර්ෂය සඳහා උපයෝජනය කළ මුදල | | 2013 දෙසැම්බර් 31 දිනට උපයෝජනය කළ මුදල | |
|---|---|---|---|---|---|---|---|
| | එජඩො මිලියන | රු.මිලියන | රු.මිලියන | එජඩො මිලියන | රු.මිලියන | එජඩො මිලියන | රු.මිලියන |
| ආසියානු සංවර්ධන බැංකුව | 15 | 1,920 | 45 | - | - | 10 | 1,354 |
| ශ්‍රී ලංකා රජය | - | - | 10 | 0.18 | 23.92 | 3.34 | 428 |
| එකතුව | 15 | 1,920 | 55 | 0.18 | 23.92 | 13.34 | 1,782 |

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ඉහත තොරතුරු අනුව, ආසියානු සංවර්ධන බැංකුවෙන් වෙන් කරන ලද රු.මිලියන 1,920 කට සමාන එජඩො මිලියන 15 න්, රු.මිලියන 1,354 කට සමාන එජඩො මිලියන 10 ක මුදල් උපයෝජනය කර තිබුණි. එබැවින් වැඩ සටහනේ දීර්ඝ කරන ලද කාල පරිච්ඡේදයද ඇතුළත්ව වර්ෂ 7 ක මෙහෙයුම් කාලය අවසානය වන විටත් වැඩ සටහනේ මුළු ප්‍රතිපාදනයෙන් සියයට 66 ක් පමණක් උපයෝජනය කර තිබුණි.

(ආ) ණය ගිවිසුමට අනුව දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට, සුරා බදු දෙපාර්තමේන්තුවට හා ශ්‍රී ලකා රේගුවට උපකරණ සැපයීම මගින් ආදායම් පරිපාලනය ශක්තිමත් කිරීම වැඩ සටහනේ ප්‍රධාන අරමුණ විය. එබැවින් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට උපකරණ සැපයීම මගින් ආදායම් පරිපාලනය ශක්තිමත් කිරීම සඳහා රු.මිලියන 1,031 ක මුදලක් වැයකර තිබුණි. තවද, මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය සඳහා රු.මිලියන 701.28 ක මුදලක් වැයකර තිබූ අතර රු.මිලියන 667.94 ක පිරිවැයකට මූල්‍ය අධ්‍යයන ආයතනයේ (මිලෝදා) සිදුකරන ලද සංවර්ධන කාර්යයන් එයට ඇතුළත් විය. එයට අමතරව, සුරා බදු දෙපාර්තමේන්තුවේ කාර්යයන් ශක්තිමත් කිරීම සඳහා රු.මිලියන 2.29 ක මුදලක් වැය කර තිබුණි.

මේ සම්බන්ධයෙන් තවදුරටත් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ලැබුණු තොරතුරු අනුව, ප්‍රධානතම ආදායම් ලබන ආයතනය වන ශ්‍රී ලංකා රේගුව සඳහා කරන ලද මුළු වෙන් කිරීමෙන් කිසිදු සංවර්ධන කටයුත්තක් සඳහා වැයකර නොතිබුණි. මුළු වියදමෙන් රු.මිලියන 2.29 ක් හෙවත් සියයට 0.13 ක් පමණක් සුරා බදු දෙපාර්තමේන්තුවට වැයකර තිබුණි.

(ii) මූල්‍ය අධ්‍යයන ආයතනය ස්ථාපනය කිරීම සඳහා රේගු දෙපාර්තමේන්තුවේ පැරණි ගොඩනැගිල්ල නවීකරණය වෙනුවෙන් සිදුකරන ලද වැඩ, වැඩ සටහනේ අරමුණු ඉටුකර ගැනීමට සෘජුවම අදාළ නොවන බව නිරීක්ෂණය විය. තවද මේ සම්බන්ධයෙන් දරන ලද රු.මිලියන 287.97 ක් වූ වියදම් සඳහා විධිමත් අනුමැතියක් ලබාගෙන නොතිබුණි.